At present, we do not have a high-quality scan copy of the O/L past paper for this subject. The version uploaded here is intended solely for educational purposes. Please note that the answers marked on the paper by students may not be accurate.

If you have a quality scanned copy of this past paper, we would greatly appreciate it if you could share it with us. You may send it to our email address: pastpapers.wiki@gmail.com

Thank you for your support! - Team Past Paper Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**50 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

නාට්‍ය හා රංග කලාව (සිංහල) I, II
நாடகமும் அரங்கியலும் (சிங்களம்) I, II
Drama and Theatre (Sinhala) I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## නාට්‍ය හා රංග කලාව (සිංහල) I

උපදෙස්:

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගන්න.
- ※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

● පහත දැක්වෙන කවි, සිංදු හා ගීත ඇසුරෙන් අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A
දිරියෙන් යුද කළ ඔබ සමගින්නේ
සෙනගින් පිහිට ද නොම සොයමින්නේ
තනියෙන් සටනට සැරසී එමිනේ
මෙකගින් ඇයි ඔහු ගෙල සිඳලන්නේ

B
අඳුන් ගාන්නී නෙත් දෙක ඔමරි කරන්නී
මල් ගවසන්නී කොණ්ඩේ ගොතා හෙළන්නී
තෝඩු දමන්නී පවලන් මාල බඳින්නී
සේල අඳින්නී පටකින් ඔමරි දමන්නී

C
මේ රට සිටිනා මහතුන් අණටා
ආමි වියන් බඳිනා ලෙස මෙරටා
ජේඩි හමා කියමින් කෙළි කවටා
තෑගි දෙතොත් නටනෙමි සොඳ රුවටා

D
සුවඳ පත්ම ඔලු ආදි – නොයෙක පුෂ්පයෙන් සැදී
සරන හංස සේරු බෝම – පොකුණු සිත පැන් පිරී

E
අත්තක පිපි මලක් ලෙසේ
පෙත්තක ඇදි ඉරක් ලෙසේ
සත්තක මගෙ පුතුගෙ ලෙසේ
නෙත් දෙක හැර බලන් මෙසේ

1. උඩරට පැරණි ගැමි නාටකය හා සම්බන්ධ වන්නේ
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

2. කෝලම් නාටක හා සම්බන්ධ වන්නේ
   (1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

3. රට යකුම ශාන්තිකර්මයට අයත් වන්නේ,
   (1) B ය. (2) C ය. (3) D ය. (4) E ය.

[දෙවැනි පිටුව බලන්න.

4. දුටුගැමුණු තූර්තියේ එන ගායනයක් වන්නේ,
(1) A ය. (2) C ය. (3) D ය. (4) E ය.

5. නෘත්ත යනු
(1) අභිනය තුනකින් යුක්ත නර්තනයකි. (2) භාව ප්‍රකාශනයෙන් තොර නැටුමකි.
(3) කාව්‍ය ශාස්ත්‍රයෙහි සඳහන් වන සංකල්පයකි. (4) කතක් නර්තන අංගයකි.

6. "ප්‍රාසංගික කලා" යන්නට වඩාත් ගැළපෙන ප්‍රකාශය වන්නේ,
(1) නර්තනය මෙන්ම චිත්‍ර සහ මූර්ති ද ප්‍රාසංගික කලා ගණයට අයත් ය.
(2) තිරයක් මත නරඹන වීඩියෝ නාට්‍ය දර්ශන ප්‍රාසාංගික කලා ගණයට අයත් ය.
(3) චිත්‍රපට නැටුම් දර්ශන ද ප්‍රාසංගික කලා ගණයට අයත් ය.
(4) සජීවී ශිල්පීන් හා ප්‍රේක්ෂක සහභාගිත්වය සහිත ව ඉදිරිපත් කරන කලාවක් ය.

7. නාට්‍යධර්මී සහ ලෝකධර්මී ලෙස ප්‍රධාන ශෛලීන් දෙකකට නාට්‍ය වෙන්කර හඳුනාගත හැකි බව ප්‍රථමයෙන් ම ප්‍රකාශ කළ පඬිවරයා කවු ද?
(1) ඇරිස්ටෝටල් (2) භරතමුනි (3) නන්දිකේශ්වර (4) ධනංජය

8. ප්‍රාසංගික කලාවක් වන ඔපෙරාවෙහි ප්‍රධාන අංගයක් වන්නේ,
(1) අභිරූපණය යි. (2) නර්තනය යි. (3) සංවාදය යි. (4) සංගීතය යි.

9. දෘශ්‍ය කලාවන්ට වඩා නාට්‍ය කලාවෙහි ඇති එක් වෙනසක් වන්නේ
(1) ප්‍රේක්ෂක ප්‍රතිචාර අනුව සකස්වීම යි.
(2) චිත්‍ර වස්ත්‍ර යොදා ගැනීම යි.
(3) චිත්‍ර හා මූර්ති පසුතල නිර්මාණ සඳහා භාවිතයට ගැනීම යි.
(4) විවිධ වර්ණ හා හැඩතල භාවිතයට ගැනීම යි.

10. ශ්වසන සහ සංවේදන අභ්‍යාස රූපණ ශිල්පියකුට වැදගත් වන්නේ,
(1) නිවැරදි ව වචන උච්චාරණයට සහ සිරුරේ ඉන්ද්‍රියන් පාලනයට ය.
(2) නිවැරදි ව හුස්ම ගැනීමට සහ ශරීර නම්‍යශීලීභාවයට ය.
(3) සමබර පෞරුෂයට සහ සෙසු රූපණ ශිල්පීන් සමග සංවේදී ව කටයුතු කිරීමට ය.
(4) විධිමත් චලන භාවිතයට සහ නිවැරදි රූපණයට ය.

11. ආලවක දමනය බෞද්ධ පූජාකර්මයට අයත් චරිතය කුමක් ද?
(1) දේවදූතයා (2) ගදුභ (3) නාගසේන හිමි (4) කාලි යක්ෂිණිය

12. ජන සංගීත තනු යොදාගනිමින් ගීත නාටකයක් නිර්මාණය කළ අධ්‍යක්ෂවරයා කවුද?
(1) දයානන්ද ගුණවර්ධන (2) ප්‍රේමසිරි කේමදාස
(3) ඩබ්ලිව්.බී. මකුලොලුව (4) ගුණසේන ගලප්පත්ති

13. පාසලේ දී රංග අභ්‍යාස හා රංග ක්‍රීඩාවල යෙදීමෙන් සිසුන් ගේ
(1) ඉගෙනීමේ කටයුතුවලට බාධා පැමිණේ. (2) දැනුම හා ආකල්ප පමණක් වර්ධනය වේ.
(3) උසස් ගුණධර්ම සියල්ල දියුණු වේ. (4) සබකෝලය දුරු වේ.

14. නාට්‍යයක චරිත අංග රචනය කිරීමේ දී වඩාත් සැලකිලිමත් වියයුතු වන්නේ,
(1) ශෛලිය කෙරෙහි ය.
(2) රංගාලෝකය කෙරෙහි ය.
(3) ප්‍රේක්ෂාව කෙරෙහි ය.
(4) රූපණ ශිල්පීන් ගේ පෞරුෂය කෙරෙහි ය.

15. නාට්‍යයක නළු-නිළියන් සඳහා වේෂභූෂණ සකස් කිරීමේ දී
(1) සැමවිට ම දීප්තිමත් වර්ණ යොදාගත යුතු ය.
(2) නාට්‍යයේ තේමාව ඉස්මතු කළ යුතු ය.
(3) රංගාලෝකය පමණක් සැලකිල්ලට ගත යුතු ය.
(4) කතාවෙන් නිරූපිත දේශය සහ යුගය නියෝජන කළ යුතු ය.

16. අධ්‍යක්ෂවරයා නාට්‍යයට සපයනු ලබන අර්ථ කථනය පවත්වාගෙන යාමේ වගකීම වඩාත් ම පැවරී ඇත්තේ කා හට ද?
(1) අංග රචනා ශිල්පියාට (2) රූපණ ශිල්පීන්ට (3) රංගාලෝක ශිල්පියාට (4) වේදිකා කළමනාකරුට

- පහත දැක්වෙන වගුව ඇසුරෙන් අංක **17** සිට **20** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | රචකයා ගේ නම | පරිවර්තනය/අනුවර්තනය | මෙරට නිෂ්පාදක/අනුවර්තක |
|---|---|---|---|
| **A** | මැක්සිම් ගෝර්කි | හිරු නැති ලොව | රංජිත් ධර්මකීර්ති |
| ද ත්‍රී පෙනි ඔපෙරා | බර්ට්‍රෝල්ට් බ්‍රෙෂ්ට් | පැන්ස තුනේ කතාව | **B** |
| රත්නාවලී නාටිකා | **C** | රත්නාවලී | පියදාස නිශ්ශංක |
| එව්රි මෑන් (ජෙඩර් මෑන්) | හියුගෝ ෆොන් හොෆ්මන්ස්තාල් | **D** | බන්දුල ජයවර්ධන |

17. ඉහත වගුවේ **A** කොටුවට ඇතුළත් විය යුතු මුල් නාට්‍ය කෘතියේ නම කුමක් ද?
(1) ද ග්ලාස් මෙනාජරි (2) ද ලෝවර් ඩෙප්ත්ස් (3) රන් ෆෝ යුවර් වයිෆ් (4) ද ඩ්‍රැගන්

18. ඉහත වගුවේ **B** කොටුවට ඇතුළත් විය යුතු මෙරට නිෂ්පාදක ගේ නම කුමක් ද?
(1) හෙන්රි ජයසේන (2) විජිත ගුණරත්න
(3) රන්ජිත් ධර්මකීර්ති (4) ජයලත් මනෝරත්න

19. ඉහත වගුවේ **C** කොටුවට ඇතුළත් විය යුතු නාට්‍ය රචකයා ගේ නම කුමක් ද?
(1) ශුද්‍රක (2) කාලිදාස (3) ශ්‍රී හර්ෂ (4) ධනංජය

20. ඉහත වගුවේ **D** කොටුවට ඇතුළත් විය යුතු අනුවර්තන නාට්‍යයේ නම කුමක් ද?
(1) සලක ජන (2) ජන හතුරා (3) වෙස් මුහුණු (4) මහගෙදර

21. අභිරූපණ රංගනය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) එහි අංග රචනය සාත්ත්වික අභිනය ප්‍රකාශයට ප්‍රබල රුකුලක් නොවේ.
(2) තාත්විකත්වය ඉක්මවූ අතිශයෝක්තියක් චරිත නිරූපණයෙහි නොමැත.
(3) එයට ම ආවේණික ගමන් රටා කිහිපයක් ඇත.
(4) කේවල රංගනයක් ලෙස පමණක් ඉදිරිපත් කෙරේ.

22. ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් රචනා කොට අධ්‍යක්ෂණය කළ කලාකරුවා කවුද?
(1) හෙන්රි ජයසේන (2) කේ.බී. හේරත්
(3) සුගතපාල ද සිල්වා (4) ජයලත් මනෝරත්න

23. පහත දැක්වෙන සංගීතඥයන් අතුරෙන් නූර්ති සංගීතය සඳහා වඩාත් ප්‍රසිද්ධ වූයේ,
(1) ෂෙල්ටන් ප්‍රේමරත්න ය. (2) ආර්. මුත්තුසාමි ය.
(3) මොහොමඩ් ගෞස් ය. (4) විශ්වනාත් ලෞජී ය.

24. 'මරා ඉපැද්දීම' නම් අන්තර් රංග අවස්ථාව ඇතුළත් වන්නේ කුමන ශාන්තිකර්මවල ද?
(1) ගම්මඩුව සහ කිරි මඩුව (2) පූනා මඩුව සහ කිරි මඩුව
(3) මංගර මඩුව සහ හැල්ලුම් මඩුව (4) කිරි මඩුව සහ පහන් මඩුව

- පහත දැක්වෙන ඡායාරූප ඇසුරෙන් අංක **25** සිට **28** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.


A


B


C


D


E

25. මූදු පුත්තු නාට්‍ය නිර්මාණය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

/ හතරවැනි පිටුව බලන්න.

26. කෙටි නාට්‍ය රංගනය හා සම්බන්ධ වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) E ය.

27. ලංකාවේ වීථි නාට්‍ය කලාවේ පුරෝගාමියා ලෙස සැලකෙන්නේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

28. සිංහබාහු නාට්‍යයට රූපණයෙන් දායක වූයේ,
(1) A ය. (2) B ය. (3) D ය. (4) E ය.

29. පළල් දිග අත්වලින් යුතු සුදු ලෝගුව හා හිසට සුදු ජටාව ඇඳගත් නාඩගම් චරිතය වන්නේ,
(1) බහුබූතයා ය. (2) සෙල්ලන් ළමා ය.
(3) හඬ දූතයා ය. (4) පොතේ ගුරුන්නාන්සේ

30. බ්‍රම්පෝඩ් සහ බැලසන්ත යන නාඩගම් දෙක රචනා කරන ලද්දේ කා විසින් ද?
(1) පිලිප්පු සිඤ්ඤෝ ය. (2) වී ක්‍රිස්තියන් පෙරේරා ය.
(3) ගාබ්‍රියෙල් ප්‍රනාන්දු ය. (4) චාර්ලිස් ද ආබෲව් ය.

31. අංග රචනා ශිල්පියා චරිත නිරූපණය සඳහා අංග රචනය කිරීමේ දී
(1) නළුවා ජීවත්වන දේශය හා යුගය පිළිබඳ අවබෝධයකින් කළ යුතු ය.
(2) නළුවා ගේ සාමාජික, ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගත යුතු ය.
(3) නළුවන් වේෂභූෂණවලින් සැරසී පැමිණිය යුතු ය.
(4) නළුවා ගේ සමේ වර්ණය හා මුහුණේ හැඩය පිළිබඳ සැලකිලිමත් විය යුතු ය.

32. සමාරෝපය යනුවෙන් හැඳින්වෙන්නේ
(1) චරිත නිරූපණයට ස්වාභාවික බව ආරෝපණය කරගැනීම යි.
(2) වෙස් වෙළාගැනීමට ආහාර්ය අභිනය පමණක් භාවිත කිරීම යි.
(3) මානසික වශයෙන් හා වේෂභූෂණ ආදියෙන් චරිතයට ප්‍රවේශ වීම යි.
(4) චරිතයකට ආරූඪ වීමට මනස සකස් කරගැනීම යි.

33. නාට්‍ය සංගීතයේ මූලික අරමුණක් වන්නේ
(1) චරිතවල මනෝභාව හා අවස්ථා තීව්‍ර කිරීම යි.
(2) රඟපෑමේ හා රංග ක්‍රියාකාරකම්වල හිස්තැන් පිරවීම යි.
(3) පසුතල මාරු කරන විට වේදිකාවේ පාළුව දුරු කිරීම යි.
(4) ප්‍රේක්ෂකයා සංගීත රසයෙන් කුල්මත් කිරීම යි.

34. රිද්දි යාගයේ අන්තර්ගත නාට්‍යමය පෙළපාලි තුනක් වන්නේ,
(1) නානුමුරය, දරු නැළවිල්ල සහ කපු යක්කාරිය යි.
(2) නානු මුරය, දොළහ පෙළපාළිය සහ පන්දම් පාලිය යි.
(3) කපු යක්කාරිය, වැද්දන් ගිවිස්සීම, වී කෙටීම හා පෙළීම යි.
(4) දරු නැළවිල්ල, අඹ විදමන සහ මරා ඉපැද්දවීම යි.

35. ප්‍රමාණයෙන් වඩාත් විශාල කෝලම් වෙස් මුහුණු දෙක සඳහන් වරණය තෝරන්න.
(1) අඬබෙර සහ නොංචි (2) රජු සහ බිසව
(3) ජසයා සහ ලෙංචිනා (4) මුදලි සහ ආරච්චි

36. ළමා නාට්‍යයක පෙළ රචනය මගින්
(1) වැඩිහිටියන්ට උපදේශ ලබාදිය යුතු ය.
(2) අවවාද හා උපදෙස් පමණක් ම ප්‍රකාශ කළ යුතු ය.
(3) අවවාද හා උපදෙස් ව්‍යංග්‍යයෙන් ඉදිරිපත් කළ යුතු ය.
(4) ආදර්ශමත් කතා පමණක් පැවසිය යුතු ය.

37. විකෘති නාට්‍යයේ තේමාව වන්නේ
(1) දෙමව්පියන් ගේ අපේක්ෂා ඉටුකිරීමට තරගවලට යන සිසුන්ගේ ඛේදවාචකය ය.
(2) තරගකාරී අධ්‍යාපන ක්‍රමයට වෙහෙසෙන දෙමාපියන් ගේ ඛේදවාචකය ය.
(3) විවෘත ආර්ථිකය නිසා දරුවන් හා දෙමාපියන් පත්වන අසරණ තත්ත්වය ය.
(4) තරගකාරී අධ්‍යාපන ක්‍රමය හමුවේ යෞවන අපේක්ෂා බිඳ වැටීම ය.

38. සිරිසේන විමලවීර විසින් රචිත නාට්‍ය තුනක් පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) රොඩී කෙල්ල, විධුර සහ මග්ගොන වාලි
(2) උමතු විශ්වාසය, කපටි ආරක්ෂකයා සහ අයිරාංගනී
(3) මහාසාර, වෙල්ලවැහුං සහ බහින කලාව
(4) නන්දි විසාල, වැරදුණු කුරුමානම සහ වනලිය

39. අයිරාංගනී සේරසිංහ ප්‍රථමයෙන් වේදිකා නාට්‍ය සඳහා අවතීර්ණ වන්නේ
(1) මිනර්වා නාට්‍ය නිෂ්පාදනවලින් ය.
(2) ඒ.එෆ්.සී. ලුඩොවයික්ගේ නාට්‍ය නිෂ්පාදනවලින් ය.
(3) නියුමාන් ජුබාල්ගේ නාට්‍ය නිෂ්පාදනවලින් ය.
(4) එදිරිවීර සරච්චන්ද්‍රගේ නාට්‍ය නිෂ්පාදනවලින් ය.

40. නාට්‍යයක් පුහුණුවීමේ සිට මංගල දර්ශනය පෙන්වීම දක්වා අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ ඇතුළත් වරණය කුමක් ද?
(1) ජවනිකා පුහුණුව, පෙළ කියැවීම, ආලෝක හා කාර්මික පුහුණුව සහ සවේශ පුහුණුව යි.
(2) ආලෝක හා කාර්මික පුහුණුව, ජවනිකා පුහුණුව, සවේශ පුහුණුව සහ පෙළ කියැවීම යි.
(3) පෙළ කියැවීම, ආලෝක හා කාර්මික පුහුණුව, සවේශ පුහුණුව සහ ජවනිකා පුහුණුව යි.
(4) පෙළ කියැවීම, ජවනිකා පුහුණුව, ආලෝක හා කාර්මික පුහුණුව සහ සවේශ පුහුණුව යි.

* *

Downloaded from 'Past Papers Wiki' - Web: www.pastpapers.wiki

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**50 | S | I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2024(2025)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2024(2025)
General Certificate of Education (Ord. Level) Examination, 2024(2025)

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව (සිංහල) | I, II |
| நாடகமும் அரங்கியலும் (சிங்களம்) | I, II |
| Drama and Theatre (Sinhala) | I, II |

## නාට්‍ය හා රංග කලාව (සිංහල) II

※ **පළමුවැනි** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළු ව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
   (i) දික්තල කාලගෝල නාට්‍යයේ සිංදු රාග තාල සහ රචනය කාගේ ද? (ලකුණු 02 යි)
   (ii) මෙම නාට්‍යයේ පූර්ව රංගයේ ඇතුළත් වන චරිත **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (iii) කාලගෝල තම බිරිඳ ලෙස දික්තල ලබාගත්තේ කෙසේ ද? (ලකුණු 02 යි)
   (iv) දික්තල ගයන රත්දර සිරියා පරදන .....' යන සිංදුව අනුව ඇය ගේ සිතේ පවතින දුකට හේතුව කුමක් ද? (ලකුණු 02 යි)
   (v) දික්පිටියා දුටු විට දික්තල ගේ සිත ඔහු වෙත ඇදී ගියේ ඇයි? (ලකුණු 02 යි)
   (vi) නාට්‍ය අවසානයේ මහෞෂධ පඬිතුමා ගෝලයින්ට පවසන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

2. (i) ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) උඩරට ශාන්තිකර්මයක් නම් කර, එහි ඇති අන්තර් රංග අවස්ථා **තුනක්** දක්වන්න. (ලකුණු 04 යි)
   (iii) ඉහත (ii) හි සඳහන් කළ අන්තර් රංග අවස්ථා අතුරෙන් **එකක්** තෝරාගෙන එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) සොකරි රඟ දැක්වීමේ අරමුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) සොකරි නාට්‍යයේ මූලික කතා පුවත කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)
   (iii) ඉහත (ii) හි සඳහන් කළ කතා පුවත රඟ දැක්වෙන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4. (i) වර්තමානයේ නාට්‍ය රඟ දැක්වීමට වැඩි වශයෙන් භාවිත වන වේදිකා වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)
   (ii) රංග භූමිය මත රඟපෑමේ දී නළු-නිළියන් විසින් අවධානය යොමු කළ යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) රංග භූමිය මත නළු-නිළියන් ස්ථානගත කරන විට නාට්‍ය අධ්‍යක්ෂවරයා සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

5. (i) 'කෙටි නාට්‍ය' යනු කුමක් දැ යි නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)
   (ii) කෙටි නාට්‍යවලට ආවේණික සුවිශේෂ ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (iii) කෙටි නාට්‍ය රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා දැ යි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

...පිටුව බලන්න.

6. (i) 1970 - 1990 අතර කාලය තුළ ශ්‍රී ලංකාවේ නාට්‍ය කලාවේ ප්‍රගමනයට දායක වූ ප්‍රකට රංගන ශිල්පියකු හා ශිල්පිනියක නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ඉහත (i) හි නම් කරන ලද දෙදෙනා රඟපෑ නාට්‍ය **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඉහත (i) හි සඳහන් කළ එක් රංගන ශිල්පියකු හෝ ශිල්පිනියක රඟ පෑ චරිත, ඒවා ඇතුළත් නාට්‍ය වර්ග හා රංග ශෛලිය, ඔවුන් ගේ නිරූපණ කුශලතා හා දක්ෂතා අගය කරමින් පාසල් බිත්ති පුවත්පතකට ලිපියක් සම්පාදනය කරන්න. (ලකුණු 06 යි)

7. පහත දැක්වෙන කථා සාරාංශය පදනම් කරගෙන ඒකාංක නාට්‍යයක් රචනා කරන්න. පැය කිහිපයක් තුළ සිදුවන සිද්ධීන් එක ස්ථානයකට සීමා වන සේ නාට්‍ය වස්තුව සකස් කළ යුතු ය.

චතුර සහ දසුන් එක ම පන්තියේ ඉගැනුම ලබන සිසුන් දෙදෙනෙකි. චතුර ගායනයට දක්ෂ ය. එහෙත් ඔහු ලජ්ජාශීලී නිසා කිසිදු තරගයකට ඉදිරිපත් නො වේ. දසුන් මුඛරි ය. අනුන් අනුකරණය කිරීමට දක්ෂයෙකි. අනුලා ගුරුතුමිය ළමා නාට්‍යයක් නිපදවීමට සූදානම් වේ. ගායනයට හා රඟපෑමට කැමති සිසුන්ට හෙට සිට නාට්‍ය පුහුණුවීම්වලට එන ලෙස ගුරුතුමිය දැනුම් දුන් බව දසුන් චතුරට පවසයි.

(i) පසුබිම, කාලය, සිදුවීම හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු 04 යි)

(ii) චරිත අතර ගැටුමක් ඇති වන අයුරින් අවස්ථාව ගොඩනැගීම සඳහා (ලකුණු 04 යි)

(iii) කුතුහලය දනවන නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු 04 යි)

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded from 'Past Papers Wiki' - Most Extensive Wikipedia of Past Papers!

PARCEL NO
www.LOL.LK

LOL.lk
BookStore

# විභාග ඉලක්ක
# පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න






කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**